**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය - 2018**

---

## 1.1 මතය වියාචනය

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් මාස හය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස හය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.2 මතය වියාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය වියාචනය සඳහා පදනමක් සැපයීම ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 21 ඡේදය ප්‍රකාරව රාජ්‍ය අංශයේ පොදු අවශ්‍යතාවයන් වෙනුවෙන් තීරණ ගැනීමේ කාර්යය සඳහා ප්‍රයෝජනවත් තොරතුරු සැපයීමේ අරමුණින් සියලුම සංරචක වලින් සමන්විත සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල ශුද්ධ වත්කම්/ ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි. | 2019 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමට අදාල නිළධාරීන්ට උපදෙස් දෙන ලදි. | ගිණුම්කරණ ප්‍රමිතවල දක්වා ඇති සියලුම තොරතුරු ඉදිරිපත් කළහැකි පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ජාතික සමගිය හා සංහිඳියා රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2018 වර්ෂය තුලදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙනුවෙන් රු.24,727,255 ක පුනරාවර්තන වියදම් හා රු.9,612,111 ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් එකතුව රු. 34,339,366 වැයකර තිබුණි. එසේවුවද අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවල එම වියදම රු.30,450,000 ක් වශයෙන් දක්වා තිබුණද,වෙනස රු. 3,889,366 ක් සම්බන්ධයෙන් අවශ්‍ය පැහැදිලි කිරීම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2018/07/01 දින සිට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ගිණුම් කටයුතු ආරම්භකර ඇති අතර මෙම ආයතනය විසින් සිදු කරන ලද රු: 30,450,000/-ක් පමණක් මෙම ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්කර ඇත. එසේ වුවද 2018.07.01 ට පෙර අමාත්‍යාංශ විසින් මෙම කාර්යාලය සඳහා සිදුකරන ලදැයි කියවෙන රු: 24,727,255ක පුනරාවර්තන වියදම් සහ රු: 9,612,111 ප්‍රාග්ධන වියදම් පිළිබඳ කිසිදු විස්තරයක් මෙම කාර්යාලය සතුව නොමැති අතර එකී වියදම් මෙම කාර්යාලය විසින් සිදු කරන ලද වියදම් නොවන බැවින් ඒවා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොමැත. | මහා භාණ්ඩාගාරය විසින් අමාත්‍යාංශය හරහා කාර්යාලය වෙත ලබා දෙන සියලුම පුනරාවර්ථන හා ප්‍රාග්ධන ප්‍රදාන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු වියදම් රු.228,647 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. එසේම කාර්ය මණ්ඩලය පුහුණු කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී දරන ලද රු.150,750ක වියදම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ස්ථාවර වත්කම් යටතේ විලම්භිත වියදමක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරි වර්ෂ වලදී අදාල වියදම් වර්ෂයේ පුනරාවර්තන වියදම් ලෙස නිවැරදිව ගිණුම් ගත කිරීමටත් මෙම වියදම් 2019 වර්ෂයේ කපා හැරීමටත් සටහන් කර ගන්නා ලදි. | වියදම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් ලබාදුන් ලැප්ටොප් පරිගණක 5 ක වටිනාකම වූ රු.990,000 මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2019 වර්ෂයේ අදාල වත්කම් ගිණුම්ගත කිරීමට සටහන් කර ගන්නා ලදී. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමටත් එම වත්කම්, වත්කම් ලේඛන වලට ඇතුළත් කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඉ) | කාර්යාල උපකරණ අයිතම් 127 ක්, යූ.පී.එස් 07 ක්, මුද්‍රණ යන්ත්‍ර 07 ක්, ඡායා පිටපත් යන්ත්‍ර 01 හා ෆැක්ස් යන්ත්‍ර 01 ක් සමාලෝචිත වර්ෂය තුලදී අමාත්‍යාංශයෙන් මෙම කාර්යාලයට ලබා දී තිබුණි. එසේ වුවත් එම වත්කමවල වටිනාකම් අමාත්‍යාංශයෙන් ලබා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල තොරතුරු අමාත්‍යාංශය මගින් ලබාගෙන ගිණුම් ගත කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. | - එම - |

## 1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති අංක 12/2003 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1ඡේදය | 2018 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් තුල ඉදිරිපත් කළ යුතු වුවද, 2019 සැප්තැම්බර් 04 දින ඉදිරිපත් කර තිබුණි. | අප ආයතනයේ ගිණුම් කටයුතු ආරම්භ වී 2018/12/31 වැනි දිනට මාස 06 ක් ගත වී ඇත. පුහුණු කාර්ය මණ්ඩලයේ හිඟකම නිසා මෙම තත්ත්වය උද්ගත වී ඇති අතර දැනට ස්ථිර කාර්ය මණ්ඩලය බඳවා ගන්නා බැවින් ඉදිරියේදී මෙවැනි ප්‍රමාදයන් වලක්වාගත හැකිය. | චක්‍ර ලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 ඡේදය | 2018 වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2019 මාර්තු 17 දිනට පෙර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීයාට පිටපතක් සහිතව විගණකාධිපති වෙත යොමු කල යුතු වුවද, 2019 මැයි 31 දින දක්වාම භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | සමීක්ෂණ මණ්ඩලවලට පත් කිරීම සඳහා දැනුම හා පළපුරුද්ද ඇති නිලධාරීන්ගේ හිඟය නිසා මෙම තත්ත්වය උදාවී ඇත. දැනට ස්ථිර කාර්යමණ්ඩල බඳවා ගන්නා බැවින් මෙවැනි තත්ත්වයන් ඉදිරියේදී වලක්වාගත හැකිය. 2018 වර්ෂය සඳහා ස්ථාවර වත්කම් සමීක්ෂණය මේ වන විට අවසන් වී ඇත. | - එම - |

## 2. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මාස හය සඳහා මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු.2,076,345 ක ඌනතාවයක් නිරීක්ෂණය විය.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**-------------------------------**

**මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 28 ක් වුවද, තථ්‍ය කාර්ය මණ්ඩලය 22 දෙදෙනාම කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් අය වූ අතර, පුරප්පාඩු සංඛ්‍යාව 06 ක් විය. . | කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් බඳවාගැනීමේ පටිපාටිය අනුමත කරවා ගැනීමට ප්‍රමාද වුවත් කාර්යාල කටයුතු කඩිනමින් ආරම්භ කළයුතු නිසා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සිදු කරන ලදි. | ස්ථිර කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |